සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

8262

## 6 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ............................................................................... කාලය : පැය 01 1/2 යි.

## I කොටස

❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සංගීතයේ මාධ්‍යය වන්නේ,
 1. අංග චලනයයි. 2. වර්ණ හා රේඛායි. 3. නාද හා ස්වරයි. 4. හැඩතලයි.

02. 'කඳුපෙළ අතරේ තුරු වදුලේ ' යන ශුද්ධ ස්වර ස්ථාපන ගීතයේ ස්වර පරාසය කුමක් ද?
 1. සඩ්ජය සිට පංචමය දක්වා 2. සඩ්ජය සිට උච්ච සඩ්ජය දක්වා
 3. මන්ද්‍ර ධෛවතය සිට මධ්‍ය ධෛවතය දක්වා 4. සඩ්ජය සිට මධ්‍යමය දක්වා

03. පංචමයේ හඬට වඩා ඉහළ හඬක් ඇති ස්වරයකි.
 1. මධ්‍යමය 2. සඩ්ජය 3. නිෂාදය 4. ගාන්ධාරය

04. තාල රූපයක ඇති ඉතා කුඩා මිම්ම,
 1. අක්ෂරයයි. 2. මාත්‍රාවයි. 3. රිද්මයයි 4. විභාගයයි

05. සුෂිර වාද්‍ය භාණ්ඩයකි.
 1. පියානෝව 2. සින්තසයියරය 3. විදුලි ඕගනය 4. සර්පිනාව

❖ වරහන් තුළ ඇති වචන යොදාගෙන හිස්තැන් පුරවන්න.

(ආනන්ද සමරකෝන්, පහලය, ස්වර ස්ථාපන, පල්ටා - අලංකාර, සාමාජයීය ගී)

06. සංගීතය ඉගෙන ගන්නා ආධුනිකයෙකුට ............................................ ගීත ගායනය ඉතා වැදගත් වේ.

07. ස්වර අභ්‍යාස ............................................ යන නම්වලින් ද හඳුන්වනු ලැබේ.

08. ශුද්ධ ස්වරයේ හඬට වඩා කෝමල ස්වරයේ හඬ ............................................ .

09. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘ ............................................ මහතාය.

10. ජන ගී වර්ගීකරණය යටතේ කෙළි ගී ............................................ ගණයට අයත්වේ.

❖ පහත ප්‍රකාශ නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද, එක් එක් ප්‍රකාශය ඉදිරියේ ඇති කොටුවේ සඳහන් කරන්න.

11. උච්ච ස්වර හඳුනාගැනීමට ස්වරයට උඩින් තිතක් තබනු ලැබේ. ☐

12. නරිබෑනා නාට්‍යයේ සංගීතය නිර්මාණය කළේ දයානන්ද ගුණවර්ධන මහතාය. ☐

13. කෙළි ගී ගායනයේ දී තාලම්පට, ගැටබෙරය වැනි භාණ්ඩ සහාය වාද්‍ය භාණ්ඩ ලෙස යොදාගත හැකිය. ☐

14. 'සිරිපොද' යන වචනයෙහි ඇති ලඝු අක්ෂර ගණන තුනකි. ☐

15. ගොක් කොළ නළාව ආදේශ භාණ්ඩයක් නොවේ. ☐

❖ A කොටස හා B කොටස ගැළපෙන පරිදි යා කරන්න.

| | A | B |
|---|---|---|
| 16. | ළමා ගී | ඔලිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ..... |
| 17. | ශුද්ධ ස්වර ස්ථාපන ගී | ඇහැළ මලින් ගස් පිරිලා............ |
| 18. | කෝමල ස්වර ස්ථාපන ගී | දණ ගාද්දී ඇවිදින්නට මට අත දුන්න.......... |
| 19. | නාට්‍ය ගී | බැතිනා සිරිපා කරුණා කරනා............ |
| 20. | කෙළි ගී | පොතපත කියවා නුවණ ලබා .......... |

(ලකුණු 20)

## II කොටස

<u>ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.</u>

01) (i) පෙරදිග හා අපරදිග ස්වර සංකේත ලියා දක්වන්න.
(ii) කෝමල ගාන්ධාරය හා කෝමල නිෂාදය ස්වර සංඥා සහිතව ලියන්න. (ලකුණු 10)

02) (i) ඔබ දන්නා ශුද්ධ හෝ කෝමල ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
(ii) සරිගම, රිගමප, ගමපධ , .................... , ............................ මෙම ස්වර අභ්‍යාසයේ හිස්තැන් දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 10)

03) ස්වර පුවරුවක් ඇඳ එහි පහත දැක්වෙන ස්වර පිහිටන ස්ථාන ලකුණු කරන්න.
ස රි ගු ම ප (ලකුණු 10)

04) (i) පහත දැක්වෙන ගී පාදයේ ලඝු, ගුරු, අක්ෂර වෙන් කොට දක්වන්න.
එකට සතුටු සාගරේ
(ii) ආදේශ භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 10)